**ශීර්ෂය 13 - ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

---

1.1 **තත්ත්වාගණනය නොකළ මතය**

---

මානව හිමිකම් කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 27 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.2 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින්

කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

### 1.4 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

--------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවක් නොතිබුණු බැවින්, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| විගණන නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 115 | 2017 වර්ෂයේදී සිදුකරන ලද ගොඩනැගිලි අලුත්වැඩියාවක් වෙනුවෙන් 2018 වර්ෂයේදී රු.1,955,000ක් ගෙවා තිබුණත්, ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 2017 දෙසැම්බර් 31 දින මුලින්ම ලද ඉන්වොයිසිය විස්තරාත්මක නොවූ බැවින්, විස්තරාත්මක ඉන්වොයිසියක් ලබා ගත් අතර එහි දිනය ලෙස 2018 පෙබරවාරි 27 දැක්විණි. එහි දිනය 2018 වසරට අදාළ බැවින් මු.රෙ.115 ප්‍රකාරව අනුමැතිය ලබාගෙන නොමැත. |
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| | 2006 අප්‍රේල් 25 දිනැති අංක 06/2006 දරන චක්‍රලේඛයේ 3 හා 4 ඡේද | චක්‍රලේඛය ප්‍රකාරව කාර්යමණ්ඩලයේ වැටුප් පරිවර්තනයන් සිදුකර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව වැටුප් පරිවර්තනයන් සිදුකළ යුතුවීම. | ජාතික වැටුප් කොමිෂන් සභාවෙන් උපදෙස් විමසා ඇත. උපදෙස් ලද පසු ඉදිරි කටයුතු කිරීමට සැලැසුම් කර ඇත. |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | පුනරාවර්තන වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු රු.450,000 ක ප්‍රතිපාදන කිසිදු උපයෝජනයකින් තොරව මුළුමණින්ම ඉතිරි කර තිබුණි. | මුදල් රෙගුලාසි 50 හි සඳහන් විධිවිධාන ඉටුවන පරිදි වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු විම. | නිරීක්ෂණය හා එකඟ වෙමි. |
| (ආ) | පුනරාවර්තන වැය විෂයයන් 07 කට රු.මිලියන 36.60 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයන්වල ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 12 ක සිට සියයට 35 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | - එම - | නිරීක්ෂණය හා එකඟ වෙමි. |
| (ඇ) | ප්‍රාග්ධන වැය විෂයයන් 05 ක් සඳහා රු.මිලියන 3.51 ක අධිප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්වලින් උපයෝජනය කළ පසු ඉතිරිය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 12 ක සිට සියයට 39 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | - එම - | නිරීක්ෂණය හා එකඟ වෙමි. |

**2.3** බැංකු ගිණුම් මෙහෙයවීම

පහත සඳහන් නිරීක්‍ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කොමිෂන් සභාවේ නිල බැංකු ගිණුමට අමතරව තවත් බැංකු ගිණුම් 04 ක රු.771,072 ක ශේෂ පැවතුණු අතර 2007 සැප්තැම්බර් 05 දිනැති අංක 5/2007 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර එම බැංකු ගිණුම් වසා දැමීමට කටයුතු කර නොතිබුණි. | භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | නිරීක්ෂණය හා එකඟ වෙමි.. |

**2.4** **තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම.**

පහත සඳහන් නිරීක්‍ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 371 (2) (ආ) රෙගුලාසියට පටහැනිව අවස්ථා 03 කදී නිලධාරීන් තිදෙනෙකුට රු.100,000 ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. | මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | රු.192,000 ක අත්තිකාරම් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත ගෙවන ලදී. ඉදිරියේදී උපදෙස් අනුව කටයුතු කරනු ලැබේ. |
| (ආ) මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී දින 10 ක් ඇතුළත නිරවුල් කළ යුතුව තිබුණත්, අවස්ථා 06 කදී ලබා දී තිබුණු එකතුව රු.184,000 ක තත්කාර්ය අතුරු අග්‍රිම දින 14 ක සිට දින 63 ක කාල පරාසයක ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඉදිරිපත් කර ඇති කරුණු පිළිගන්නා අතර, ඉදිරියේදී උපදෙස් අනුව කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදී. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීත්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2018 වර්ෂය සඳහා කොමිෂන් සභාව විසින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | විමසුමේ කරුණ පිළිගන්නා අතර මේ වන විට 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කරමින් පවතී. |
| (ආ) | කොමිෂන් සභාවේ ශාඛා කාර්යාල 04 ක් විසින් 2018 ජනවාරි මාසයේ සිට ජුනි මාසය දක්වා කාලයට අදාළ මාසිකව වැඩ සැලැසුම් වාර්තා (work plan) හා සැලසුම් කළ කාර්යයන් හි ප්‍රගති වාර්තා ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවත් ශාඛා කාර්යාල 05 ක් විසින් මාස කීපයකට අදාළ එම සැලැසුම් හා වාර්තා ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | වැඩ සැලැසුම් වාර්තා (work plan) හා සැලැසුම් කළ කාර්යයන්හි ප්‍රගති වාර්තා මාසිකව ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු විම. | 2018 ජනවාරි සිට ජුනි දක්වා වැඩ සැලැසුම් වාර්තා ඉදිරිපත් කරන ලෙස අදාළ ප්‍රාදේශීය කාර්යාල වෙත දන්වා ඇති අතර පෙන්වා දෙන ලද අඩුපාඩු සම්බන්ධව අදාළ කාර්යාල දැනුවත් කරන ලදී. |

### 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්‍ෂණය කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළමු අර්ධ වර්ෂය තුළ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ පැමිණිලි හා විමර්ශන අංශය (I & I Division) විසින් පොලිස් ස්ථාන | සැලැසුම් කරන ලද පරිදි විමර්ශන වාරිකා සිදු කළ යුතු වීම. | නිලධාරීන් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම හා නිලධාරීන් ප්‍රමාණවත් නොවීම හා කාර්ය බහුලත්වය නිසා සිදු කිරීමට නොහැකි විය. |

| | | |
|---|---|---|
| විමර්ශණ චාරිකා 72ක් හා රදවාගැනීමේ මධ්‍යස්ථාන විමර්ශන චාරිකා (Detention centers visit) 10ක් විමර්ශන කිරීමට සැලසුම් කර තිබුණද, 2018 ජුනි 30 දින වන විට පොලිස් ස්ථාන විමර්ශණ චාරිකා 44ක් හා රදවාගැනීමේ මධ්‍යස්ථාන විමර්ශණ චාරිකා 11ක් පමණක් විමර්ශණය කර තිබුණි. ඒ අනුව සැලැසුම් කරන ලද පොලිස් ස්ථාන විමර්ශන චාරිකාවලින් 28ක් සිදු කර නොතිබුණි. | | |

**3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රසම්පාදන සැලැස්මට අනුව භාණ්ඩ වර්ග 04 ක් මිලදී ගැනීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු 2018 අගෝස්තු පළමු දිනට පෙර ආරම්භ කිරීමට සැලැසුම් කර තිබුණි. නමුත් එකී කාර්යයන් කිසිවක් 2018 අගෝස්තු 24 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මට අනුව කටයුතු කළ යුතු වීම. | ප්‍රසම්පාදන සැලැස්ම අනුමත කර ගැනීම ප්‍රමාද වූ බැවින් ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද විය. |

**3.4 කාර්යසාධනය**

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වාර්ෂික කාර්යසාධන වාර්තාවේ ප්‍රාදේශීය කාර්යාල වෙත ලැබී තිබුණු පැමිණිලි 3173 ක ප්‍රගතිය පිළිබඳ කිසිදු තොරතුරක් වාර්ෂික කාර්යසාධන වාර්තාවේ ඇතුළත් කර නොතිබුණි. | වාර්ෂික කාර්යසාධන වාර්තාවේ ප්‍රාදේශීය කාර්යාල වෙත ලද පැමිණිලිවල ප්‍රගතියද සඳහන් කළ යුතුවීම. | ප්‍රාදේශීය කාර්යාලවලින් අවසන් කරන ලද පැමිණිලි වල දත්ත ලැබී නොතිබීම. |

| | | | |
|---|---|---|---|
| | 2018 වර්ෂයේදී ප්‍රධාන කාර්යාලය විසින් විභාග කළ හැකි පැමිණිලි 1493 කින් පැමිණිලි 226 ක් අවසන් කර තිබුණි. එම අවසන් කරන ලද පැමිණිලි 226 කින් 37 කට පමණක් නිර්දේශ ලබා දීම්, සමතයකට පත් කිරීම් හා සහනයන් ලබා දී තිබිණි. | | |
| (ආ) | 2017 දෙසැම්බර් 31 දිනට පැමිණිලි 6465 ක් ඉතිරිව තිබුණි. මෙම පැමිණිලිවලින් 2656 ක් 2018 වර්ෂයේදී අවසන් කළ බව කාර්යසාධන වාර්තාවේ දක්වා තිබුණි. එම පැමිණිලි 2656 න් 415 කට පමණක් නිර්දේශ ලබාදීම්, සමථයට පත්වීම්, සහනයක් ලැබීම්, නියාමනයන් ලබා දීම් සිදුකර තිබුණි. | පැමිණිලි ප්‍රමාණවත් කාලයක් තුළදී අවසන් කිරීමට කටයුතු කළ යුතු වීම. | අවසන් කළ පැමිණිලි 415 ට අමතරව මූලික අයිතිවාසිකමක් අනාවරණය නොවීම, පැමිණිලි පාර්ශවය උනන්දුවක් නොදැක්වීම, ඉල්ලා අස්කර ගැනීම, වෙනත් ආයතනවලට යොමු කිරීම, අධිකරණයේ නඩු කටයුත්තක් පැවතීම, කොමිෂන් සභා විෂය පථයට අයත් නොවන බව පසුව අනාවරණය වීම හා කාලාවරෝධීවීම ආදී හේතූන් නිසාද පැමිණිලි 2241 ක් අවසන් කිරීමට කටයුතු කර තිබුණි. |

## 3.5 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා ලංසු කැඳවන අවස්ථාව වන විට ප්‍රසම්පාදන කමිටුවක් හා තාක්‍ෂණික ඇගයීම් කමිටුවක් පත්කර නොතිබුණි. ලංසු මිල විවෘත කිරීමෙන් පසුව තාක්‍ෂණික ඇගයීම් කමිටුව පමණක් පත්කර තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4.1 මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඉදිරි ප්‍රසම්පාදන කටයුතුවලදී මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කිරීම. |

| | | |
|---|---|---|
| (ආ) ඡායා පිටපත් යන්ත්‍රය මිලට ගැනීමේ ලංසු විවෘත කිරීම සම්බන්ධයෙන් මිල ගණන් විවෘත කිරිමේ කමිටු වාර්තාවක් සකස් කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඉදිරියේදී නියමිත ආකෘති පත්‍ර ප්‍රකාරව වාර්තා තබා ගන්නා බව දන්වා ඇත. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩු වී තිබුණත්, 2018 දෙසැම්බර් 31 දින වන විටත් එම තනතුර පිරවීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණකවරයකු පත්කර ගත යුතු වීම. | ඉදිරියේදී එම තනතුර පිරවීමට කටයුතු කිරීම. |